# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2127/10 - 2019 ජුනි මස 11 වැනි අඟහරුවාදා - 2019.06.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ මහියංගනය ප්‍රාදේශීය සභාවේ සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන මහියංගනය ප්‍රාදේශීය සභාවේ සභික ධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 අ (1) (අ) වගන්තිය යටතේ මහියංගනය ප්‍රාදේශීය සභාවේ අංක 12 දඹරාව කොට්ඨාසයට තේරී පත් වූ වන්නිනායක මුදියන්සේලාගේ සමන් පුෂ්ප කුමාර වන්නිනායක අයත් වන්නා වූ ස්වාධීන කණ්ඩායම් නායකයාට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම ස්වාධීන කණ්ඩායමට අයත් වන්නාවූ ද, එම මහියංගනය ප්‍රාදේශීය සභාවේ අංක 12 දඹරාව කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී ස්වාධීන කණ්ඩායමේ කණ්ඩායම් නායකයා විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා අත්තනායක මුදියන්සේලාගේ සුමනරත්න නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

මහියංගනය ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, එච්. අයි. ආර්. හතුරුසිංහ වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66 අ (1) (අ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් අත්තනායක මුදියන්සේලාගේ සුමනරත්න, මහියංගනය ප්‍රාදේශීය සභාවේ අංක 12 දඹරාව කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එච්. අයි. ආර්. හතුරුසිංහ,
තේරීම්භාර නිලධාරි,
මහියංගනය ප්‍රාදේශීය සභාව.

2019 ජුනි මස 10 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
බදුල්ල.

06 - 745




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*